ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි: 04/2018

මගේ අංකය : PA/CS/POLICY/පොදු

රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ

නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

නිදහස් චතුරස්‍රය

කොළඹ 07.

2018.08.28

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ නොකිරීම මත වැටුප් වර්ධක විලම්බනය කිරීම සම්බන්ධවයි</u>**

2013.04.02 දින සිට ක්‍රියාත්මක රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්, එම ශ්‍රේණියට පත්වූ දින සිට වසර 05ක් ඇතුළත යෝජිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුව ඇත.

02. ඒ අනුව නව සේවා ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාරව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියට 2013.04.02 දින හෝ එදිනෙන් පසු උසස්වීම් ලද නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට නියමිත වසර 05ක කාලය 2018.04.01 දිනෙන් පසු අවසන් වන අතර ඒ වන විට අදාල කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කොට නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් පහත පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/APP/4/62/2018 හා 2018.07.23 දිනැති ලිපියෙන් දන්වා ඇත.

I. පත්වීම් දින සිට අවුරුදු 05ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය සමත් නොමැති නිලධාරීන්ගේ පත්වීම් දින සිට අවුරුදු 05න් පසුව වැටුප් වර්ධකය නතර කිරීම

II. අනුයාත විභාග අවස්ථා 10 ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ පසු එම නිලධාරීන්ට නතර කරන ලද වැටුප් වර්ධක ඇතුළුව වැටුප් වර්ධක ලබාදීම

කේ.වී.පී.එම්.ජේ. ගමගේ

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්